**මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි තනතුරේ තහවුරු කරන ලද ස්ථිර සේවකයන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් හා අදාළ ලේඛන තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරී/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් 2025.11.07 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී /ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**පූර්ණ කාලීන උපශාලාධිපති II ශ්‍රේණිය (කාන්තා නේවාසිකාගාර සඳහා)**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | : | පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියකු විය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමණාකරණය පිළිබඳව පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ. |
| වැටුප් ක්‍රමය | : | UMN 3 (II) - රු. 71,365 - 18 X 1,190 – 92,785 (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | සම්මුඛ පරීක්ෂණයක් මගින්<br><br>සේවා කොන්දේසි :-<br>පූර්ණ කාලීන උපශාලාධිපතිවරු ඔවුන් පත් කරනු ලබන නේවාසිකාගාරය තුළම පදිංචිව සිටිය යුතුය. විශ්වවිද්‍යාලය මගින් තීරණය කරනු ලබන බැදුම්කරයේ වටිනාකම ඔහුගේ වැටුපෙන් අය කරනු ලැබේ. |

**තාක්ෂණික නිලධාරී (II) ශ්‍රේණිය“ආ” බණ්ඩය**

අවශ්‍ය සුදුසුකම්

(a) අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 05ක් සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම.
(සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුලත් විය යුතුය.)

හෝ

(b) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් විද්‍යාව සහ ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත්ව තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වර්ෂ 08ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම

හෝ

(c) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සහායකයකු වශයෙන් වසර 15ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

සටහන :-
බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව “පුහුණුවන තාක්ෂණික නිළධාරී” වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත් සේවක හවතුන් තනතුරෙහි තහවුරු කර II ශ්‍රේණියේ “ආ” බණ්ඩයේ තාක්ෂණික නිළධාරී තනතුරට පත් කරනු ලැබේ.

වැටුප් ක්‍රමය : U-MT I (III) රු. 51,095 – 7x540; 10x640 – 60,575 (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

ආයතනික චක්‍රලේඛ ලිපි අංක 06/2020 අනුව විශ්වවිද්‍යාල පද්ධතිය තුල තනතුරකින් වෙනත් තනතුරකට පත්කිරීමේදී රජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 09 වන වගන්තියට අනුව අදාල වැටුපෙහි පිහිටවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි

## තාක්ෂණික නිලධාරි (II) ශ්‍රේණිය"අ" ඛණ්ඩය

අවශ්‍ය සුදුසුකම්

i. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

හෝ

ii. ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

iii. අදාල විෂය ක්ෂේත්‍රයේ පිළිබඳ වන ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

iv. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාලව වසර දෙකක පූර්ණ කාලීන ඩිප්ලෝමාව සමඟ අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප් ක්‍රමය : U-MT 1 (II) රු. 57,435-7 X 640 – 9 X 890- 69,925/- (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වෛද්‍ය රසායනාගාර තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (වෙබ් අඩවි සංවර්ධනය, පවත්වාගෙන යාම, දත්ත කළමනාකරණය සහ වැඩසටහන්කරණය ඇතුලුව)/ ජීව විද්‍යාව, විද්‍යාව, ජෛව තාක්ෂණය, රසායන විද්‍යාව/ බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්පීය ක්‍රම, විද්‍යුත් හා විදුලි සංදේශ, රසායන හා ක්‍රියාවලී තාක්ෂණ ක්ෂේත්‍රයන්හි මනා දැනුමක් හා අත්දැකීමක් ඇති අයට ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

## තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) III ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්

(a) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(b) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම (N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සටහන :-
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අය සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

වැටුප් ක්‍රමය : U-MT I (III) රු. 51,095 – 7x540; 10x640 – 60,575 (මාසික)
කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)**

අවශ්‍ය සුදුසුකම් : සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : UMT 1 (III) - රු. 51,095 - 7 X 540; 10 X 640 - 60,575(මාසික) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)**

අවශ්‍ය සුදුසුකම් : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත් වීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයෙකු විය යුතුය.

වැටුප් ක්‍රමය : UMT 1 (III) - රු. 51,095-7 X 540; 10 X 640 - 60,575/- (මාසික) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය**

අවශ්‍ය සුදුසුකම් (1) (a) (i) අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත් වීම.

සහ

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන වසරක ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම.

හෝ

(b) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන උද්භිද උද්‍යානයක හා/ හෝ විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයක වසර 10 කට නොඅඩු භූමි දර්ශක වැඩ පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : UMT 1 (III) - රු. 51,095-7 X 540; 10 X 640 - 60,575/- (මාසික) (කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**ශිල්ප ප්‍රදර්ශක (II ශ්‍රේණිය)**

අවශ්‍ය සුදුසුකම් (i) පහත සඳහන් ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි ගණනක පළපුරුද්ද තිබිය යුතුය.
වාත්තු වැඩ, පෑස්සුම් වැඩ සහ කම්මල් වැඩ, යාන්ත්‍රික උපාංග , රටා සැකසීම, තහඩු වැඩ, වඩු වැඩ, ලෝහ වැඩ.

සටහන :-
ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකකට වැඩි ගණනක් සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

සහ

(ii) විශ්වවිද්‍යාලයෙහි/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක් තිබිය යුතුය.

හෝ

(iii) විශ්වවිද්‍යාලයෙහි/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක ඉහත (01) ඡේදයේ දැක්වෙන ක්ෂේත්‍රයේ පුහුණු විශේෂ ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප් ක්‍රමය : UMN 1 (III) - රු. 49,475-17 X 540- 58,655/- (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## කළමණාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන)

අවශ්‍ය සුදුසුකම් 1. අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

2. අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

a. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

b. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.

<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

ගබඩාකරණය පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්දක් සහ/හෝ අ.පො.ස (සා.පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂයය සමත්වීම.

සටහන :-

විශ්වවිද්‍යාල විසින් තීරණය කරනු ලබන පරිදි තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

වැටුප් ක්‍රමය : UMN 1 (III) - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මඟින්

ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය.

- Knowledge in Sinhala/Tamil & English Language
- Intelligent quotient and General Knowledge
- Computer Literacy
- Relevant Subject area

## කළමණාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තැබීම)

අවශ්‍ය සුදුසුකම් 1. අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

2. අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

a. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

b. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.

තනතුරට විශේෂ වූ සුදුසුකම්

a. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයකින් හෝ තාක්ෂණික විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ ශිල්පය පිළිබඳ ජාතික සහතික පත්‍රය හෝ පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන ඒ හා සමාන සුදුසුකමක් තිබීම.

හෝ

b. අ.පො.ස (උ.පෙළ) විභාගය වාණිජ්‍ය විෂය ධාරාවෙන් සමත්වීම .

වැටුප් ක්‍රමය : UMN 1 (III) - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මඟින්

ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය.

- Knowledge in Sinhala/Tamil & English Language
- Intelligent quotient and General Knowledge
- Computer Literacy
- Relevant Subject area

## පුස්තකාල තොරතුරු සහකාර (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම් 1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ 03ක් හා පහත සඳහන් විෂයයන් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

2. උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රාථමික මට්ටමේ එනම් U-PL වැටුප් කාණ්ඩයට අයත් ස්ථිර තනතුරක් දරන එම තනතුරෙහි තහවුරු කරන ලද උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයේ අවම වශයෙන් වසර පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද අයෙකු වීම.

සටහන :-

මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් සම්බන්ධව පිළිගත් ආයතනයකින් ලබාගත් සුදුසුකම ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

වැටුප් ක්‍රමය : UMN 1 (III) - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක් මඟින් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## රියදුරු (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම් 1. මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රියදුරු පළපුරුද්දක් තිබීම .

සහ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) තනතුරක හෝ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාවක් ඉටු කර තිබීම.

වැටුප් ක්‍රමය : U-PL 3 (III) - රු. 48,005 - 16 X 490 – 55,845 (මාසික)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.)

බඳවා ගන්නා ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## පෙදරේරු /ජලනල කාර්මික /පැස්සුම්කරු (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම් 1. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නොපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම.

සහ

ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නොපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අදාළ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවමය වසර පහක (05) සේවා පළපුරුද්දක් සමඟ ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා ලබා ඇති බව වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

වැටුප් ක්‍රමය : UPL 3 (III) රු. 48,005 - 16 X 490 – 55,845 (මාසික) U-PL 3 (III)
කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | 1. | ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL I)සේවකයකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතුය. |
| | | සහ |
| | (i) | අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක තනතුරේ කාර්යයන්ට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |
| | | හෝ |
| | (ii) | අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්ද තිබිය යුතුය. |
| | | හෝ |
| | 2. | ප්‍රථමික මට්ටමේ නුපුහුණු (U-PL I) සේවකයෙකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, කර්මාන්ත කුසලතා සහිත, අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් තිබිය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | U-PL-2 (III) රු. 44,575-16x490-52,415 (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | 1. | ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL I)සේවකයකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතුය. |
| | | සහ |
| | (i) | අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක තනතුරේ කාර්යයන්ට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |
| | | හෝ |
| | (ii) | අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්ද තිබිය යුතුය. |
| | | හෝ |
| | 2. | ප්‍රථමික මට්ටමේ නුපුහුණු (U-PL I) සේවකයෙකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, කර්මාන්ත කුසලතා සහිත, අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් තිබිය යුතුය. |

| | | |
|---|---|---|
| වැටුප් ක්‍රමය | : | U-PL-2 (III) රු. 44,575-16x490-52,415 (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

ලේඛකාධිකාරී,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.
2025.10.15